# DAT

# වෛද්‍යවරුන්ට පමණක් ලොකු හැන්දෙන් බෙදූ සෞඛ්‍ය සේවයේ දීමනා අර්බුදය?

## අපේ රටේ සෞඛ්‍ය සේවය කියන්නේ?

ශ්‍රී ලංකාවේ නිදහස් සෞඛ්‍ය සේවය ජනතාවගේ බදු මුදලින් ජනතාව උදෙසා පවත්වාගෙන යන්නක්. රෝහල් නඩත්තුව බෙහෙත් හේත්, පරීක්ෂණ, යන්ත්‍ර සූත්‍ර වගේම වෛද්‍යවරයාගේ සිට සාමාන්‍ය සේවකයා දක්වා වැටුප් සියල්ල මෙහි වියදම්වලට අයත්.

## සෞඛ්‍ය සේවය ඉටු කරන්නේ වෛද්‍යවරු පමණද?

ලෝකයේ ඕනෑම රටක සෞඛ්‍ය කියන්නේ සාමූහික සේවයක්. වෛද්‍යවරු, හෙද නිලධාරීන්, පරිපූරක වෛද්‍ය වෘත්තිකයින්, අතුරු වෛද්‍ය වෘත්තිකයින්, කළමනාකරණ සහකරුවන්, ගිලන් රථ රියදුරු, සාමාන්‍ය සේවකයා ආදී සේවක ගණ රැසක් තම තමන්ගේ ප්‍රවීණතා පුහුණුවක් ලැබ ඒ ඒ රාජකාරි ඉටු කරනවා. වෛද්‍යවරයා මූලික වුවත් ඔවුහු රෝග සොයා ගන්නේත්, ප්‍රතිකාර කරන්නේත් අනෙක් වෘත්තීන්ගේ සම්පූර්ණ දායකත්වයෙන්.

## වෛද්‍යවරුන්ටත් අනිත් අයටත් වැටුප් කොහොමද? දීමනා කොහොමද?

සෞඛ්‍ය සේවයේ සියලු සේවාවන්ට රජය ඔවුන්ගේ පුහුණු කාලය, ප්‍රවීණතාව, වගකීම අනුව වැටුප් තල සකස් කර තිබෙනවා. තුන්වන ලෝකයේ රටක් නිසා අපේ රටේ මේ සියළු සේවාවල වැටුප් ලෝකයේ දියුණු රටවලට සාපේක්ෂව අඩුයි. මේ වැටුප්වලට අමතරව සෞඛ්‍ය සේවයේ වෛද්‍ය, හෙද හා වෘත්තික සේවාවන්ට විවිධ කරුණු උදෙසා විවිධ දීමනා ගෙවනවා. මේ දීමනා ගෙවීමටත්, වැඩි කිරීමටත් පදනම් කරගන්නා හේතු විනිවිද නැහැ. පාලකයන්ගේ අත්තනෝමතික තීරණ නිසා මේ දීමනා උදෙසා කලින් කලට අර්බුද පැන නගිනවා.

## මොකක්ද මේ DAT දීමනාව?

රාජ්‍ය සේවයේ සියළු සේවකයින් ලබන දීමනාවන්ට අමතරව රජය විසින් වෛද්‍යවරුන් උදෙසා ගෙවන විශේෂ දීමනාවක්. **Disturbance, Availability** හා **Transport** කියන කාරණා 3 ම පදනම් කරගෙන කරන පොදු දීමනාවක්. 2008 දක්වා මෙය පැවතියේ මසකට රු. 5000/- ක්. ඉන්පසු වර්ෂවලදී වෛද්‍යවරුන්ගේ ප්‍රධාන වෘත්තීය සමිතිය වරින්වර වර්ජන තර්ජන එල්ල කරමිනුත්, පාලක පක්ෂයේ නායකයින්ට උදව් කරමිනුත් වසරකට වරක් මේ දීමනාව රු. 5000/- හා රු. 10,000/- අගයන්ගෙන් වැඩි කරගත්තා. ඒ අනුව 2023 අග වනවිට එය පැවතියේ මසකට රු. 35,000/- අගයක් ලෙස. මෙම දීමනා වැඩි කළ අවස්ථාවල සෞඛ්‍ය සේවයේ අනිකුත් වෘත්තීන්ගේ දීමනා වැඩි නොකිරීමෙන් අතීතයේදීත් වෘත්තීය අරගල පැන නැගුණා.

## වර්තමාන DAT අර්බුදය කුමක්ද?

බදු බරින් රටේ ජනතාවටම පොදුවේ පීඩා විඳිද්දී හැමෝම බදු ගෙවද්දී රජය වෛද්‍යවරුන් සඳහා පමණක් පැවති රු. 35,000/- දීමනාව තවත් රු. 35,000/- වැඩි කරමින් මාසිකව රු. 70,000/- දක්වා වැඩි කළා. සමස්ත රාජ්‍ය සේවයට වැඩි කළේ රු. 10,000/- යි. එයිනුත් ලබාදෙන්නේ රු. 5000/-, එයත් වෛද්‍යවරුන්ට ලැබෙනවා.

අ.පි.බ.

## වෛද්‍යවරුන්ට පමණක් විශේෂ වරප්‍රසාද මොනවාද? හෙද / පරිපූරක / අතුරු වෛද්‍ය සේවාවන්ට මේවා නැතිද?

- වෛද්‍යවරුන්ට අත්සන් ලේඛන නැහැ. දිනපතා පැමිණීම අත්සන් කරන්නේ තමා ළඟ ඇති දින පොත්වල.
- වැඩ කරන කාලය දිනකට පැය 6. ඉතිරි කාලයට අමතර දීමනා ලබා ගන්නවා.
- වසර 5 කට වරක් බදු නිදහස්. වාහන ආනයන බලපත්‍රයක් ලබා ගන්නවා. (මේ වනවිට තාවකාලිකව නතර කර ඇත.)
- සෞඛ්‍ය ලේකම්, සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂවරු, ආයතන ප්‍රධානීන්, සියළු දෙනා වෛද්‍යවරුන්ගෙන් පමණයි. කොතරම් උපාධි ගත්තත්, අනිත් කිසිදු වෘත්තිකයෙකුට සෞඛ්‍ය පරිපාලන සේවයට ඇතුළුවීමට බැහැ.
  **හැන්ද අතේ තියාගෙන තමන්ට පමණක් බෙදා ගැනීමට මේක ප්‍රධාන හේතුවක්...**

| වැටුපට අමතර දීමනා | DAT (මාසික) | විශේෂ දීමනා (මාසික) | අමතර දීමනා (OT පැයකට) | දුරකතන දීමනා (මාසික) | ඇමතුම්/ නිල ඇඳුම් දීමනා (මාසික) | අනතුරු දීමනා (මාසික) |
|---|---|---|---|---|---|---|
| වෛද්‍ය නිලධාරීන් | 70,000 | 3400/- | 796/- | 4000/- | නැත | නැත |
| හෙද නිලධාරීන් | නැත | 3000/- | 215/- | නැත | 1250/- | 700/- |
| පරිපූරක / අතුරු වෛද්‍ය නිලධාරීන් | නැත | 3000/- | 210/- | නැත | 1150/- | 550/- |
| කළමනාකාර සහකාර | නැත | නැත | 120/- | නැත | නැත | නැත |
| සෞඛ්‍ය රියදුරු | නැත | 1000/- | 107/- | නැත | 775/- | නැත |
| සහායක සේවා | නැත | 1000/- | 101/- | නැත | 775/- | 350/- |

## ජනතාව පීඩාවට පත් කරමින් වර්ජන කර ඉල්ලීම් ඉල්ලන්නේ ඇයි?

සෞඛ්‍ය සේවයේ කවුරු වර්ජනය කළත් රෝගීන්ගේ පැත්තෙන් අසාධාරණයි. සාකච්ඡා, උද්ඝෝෂණ, උපවාස මුලින් කළත් රජය ප්‍රතිචාර දක්වන්නේ නැහැ. අවසානයේ හදිසි සේවා සපයමින්ම වර්ජනයට අවතීර්ණ වෙන්න මේ වෘත්තීන්ට සිදු වී තිබෙනවා.

## වෛද්‍යවරුන්ට වැඩි කළ රු. 35,000/- ඉල්ලන්නේ ඇයි?

**මේ කිසිදු වෘත්තීමය සේවාවක් ඒ මුදල ඉල්ලා නැහැ. ඔවුන්ගේ ඉල්ලීම් තියෙන්නේ රු. 35,000/- ට සමානුපාතිකව ඒ ඒ කණ්ඩායම්වල පවතින වැටුපට සාපේක්ෂව දීමනා වැඩි කරන්න කියලා.**

රටේම මිනිස්සු බදු බරින් හා ආර්ථික පීඩනයෙන් විපාක විඳිද්දී වෛද්‍යවරුන්ට පමණක් ඉන් නිදහස් කරන්නට මේ දීමනාව ලබා දුන්නේ. සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය පරිපාලනය විසින්. මුදල් අමාත්‍යාංශයේ අනුමැතියෙන් වත්මන් ජනාධිපති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය විසිනුත් තමයි, **ඉතින් අපි ඉල්ලන්නේ සැමට සාධාරණයයි.**

**රෝහල්වල ප්‍රතිකාර ලබන ජනතාවනි, සමස්ත ලංකාවාසී දයාබර ජනතාවනි, දේශපාලන පක්ෂයන්හි නායක කාරකාදීනි, අපගේ ඉල්ලීම අසාධාරණද? සිදුවූ අසාධාරණකම් නිවැරදි කර ගැනීමට අප කළ යුත්තේ කුමක්ද?**

# සෞඛ්‍ය වෘත්තීය සමිති සන්ධානය